# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1996/46 - 2016 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.12.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1883/17 දරන 2014.10.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**ක්‍රියාත්මක වන දිනය :**

මෙම සංශෝධනය 2013.11.01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 නොවැම්බර් මස 02 වැනි දින.

| *තනතුර / ශ්‍රේණිය* | *(අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|
| **11.1.2.2 ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය** | I. වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ I හා II හි ලැයිස්තුගත කරන ලද විද්‍යාපති/වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) උපාධියක් හෝ විද්‍යාපති/වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය හෝ ප්‍රජා දන්ත වෛද්‍ය) උපාධියක් ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු රාජ්‍ය සේවා කොමිසම විසින් අනුමත කරන ලද ලකුණු ක්‍රමයක් මත පදනම්ව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යටත්ව ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණියේ තනතුරකට පත්කරනු ලැබීමට හිමිකම් ලබයි. |

1A - G 24680 — 09 (2016/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *තනතුර / ශ්‍රේණිය* | *(අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|
| **11.1.2.2 ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය** *(සම්බන්ධිතයි)* | II. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>III. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙනා සමාන තනතුරු පරිශිෂ්ඨ IV හි ඇතුළත් කෙරෙන අතර සේවා අවශ්‍යතා මත වරින්වර නිර්මාණය කරනු ලබන කවර තනතුරක් වුව ඊට ඇතුළත් කෙරේ.<br><br>සටහන 7 : ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙනා සෑම තනතුරක් සඳහා වන අනිවාර්ය සුදුසුකම් IV පරිශිෂ්ඨයෙහි සඳහන් සුදුසුකම් විය යුතු අතර මෙකී තනතුරු සමාන තනතුරු සේ සැලකිය යුතුය.<br><br>IV. එකී තනතුරු සඳහා අයදුම්පත්‍ර කැඳවීමේදී අයදුම්කරුවන් IV පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති අදළ අනිවාර්ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබිය යුතුය. කෙසේ වුවද 2007.04.16 දිනැති අංක 1493/3 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන විට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන තනතුරුවල සිටින නිලධාරින්ට මෙම අනිවාර්ය සුදුසුකම් අදළ නොවේ.<br><br>V. නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරක වැඩ බලන / රාජකාරි ඉටු කරන සේවා කාලය අතිරේක සුදුසුකමක් ලෙස සැලකිය යුතුය. කෙසේ වුවද එකී පත්කිරීම්, නියමිත පත්වීම් බලධරයා විසින් කරන ලද පත්වීමක් විය යුතුය.<br><br>VI. වයස් සීමාව : සියළුම නිලධාරීන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින බැවින් උපරිම වයස් සීමාව අදළ නොවේ. |

| *තනතුර / ශ්‍රේණිය* | *(ආ) තේරීම් පරිපාටිය* |
|---|---|
| **ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය** | I. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු මගින් පුරවනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු මගින් තනතුරක පුරප්පාඩුව පිරවිය නොහැකි අවස්ථාවලදී එය ප්‍රසිද්ධ කරනු ලබන අතර සේවා පළපුරුද්ද හා කුසලතාවය මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු පරිපාටියක් මත පදනම්ව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පුරප්පාඩු පුරවනු ලැබේ.<br><br>II. වාර්ෂික ස්ථාන මාරු මගින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන තෙක් පත්වීම් බලධරයා හට එකී තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත හා දැනටමත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සිටින නිලධාරින් අතරින් වැඩ බැලීමේ පදනම මත පත්වීම් සිදුකළ හැකිය. |

පරිශිෂ්ඨය IV

**ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය**

| | වෛද්‍ය ආයතනය (චක්‍රලේඛය 2-61/2006) | තනතුර | අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම් | ආයතන සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | මූලික රෝහල් (බී) | නැත | - | 40 | නැත |
| 2 | මූලික රෝහල් (ඒ) | නැත | - | 20 | නැත |
| 3 | දිස්ත්‍රික් මහ රෝහල් | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 18 | 6 |
| 4 | පළාත් මහ රෝහල | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 2 | 2 |
| 5 | ශික්ෂණ රෝහල් | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 10 | 10 |
| 6 | ශ්‍රී ලංකා ජාතික රෝහල (ශික්ෂණ) | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | නැත | නැත |
| 7 | ශ්‍රී ලංකා ජාතික රෝහල (ශික්ෂණ) | නි. අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 2 |
| 8 | රිජ්වේ ආර්යා ළමා රෝහල | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 9 | කාසල් කාන්තා රෝහල | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 10 | ද සොයිසා කාන්තා රෝහල | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 11 | කාන්තා රෝහල ශික්ෂණ (මහමෝදර) | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 12 | මානසික රෝහල, අංගොඩ | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 13 | මානසික රෝහල, මුල්ලේරියාව | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 14 | සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල, පේරාදෙණිය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 15 | ජාතික පිළිකා ආයතනය, මහරගම | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 16 | වෛද්‍ය පර්යේෂණ ආයතනය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 17 | ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 18 | ජාතික රුධිර පාරවිලයන සේවාව | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 19 | ජාතික අක්ෂි රෝහල | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 20 | ජාතික දන්තායතනය, කොළඹ | නි. අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |

**ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය** *(සම්බන්ධිතයි)*

| *විශේෂිත මහජන සෞඛ්‍ය ආයතනය* | *තනතුර* | *අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම්* | *ආයතන සංඛ්‍යාව* | *එකතුව* |
|---|---|---|---|---|
| 21 මාතෘ හා ළමා සෞඛ්‍ය | අධ්‍යක්ෂක | වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 22 සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය | අධ්‍යක්ෂක | වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 23 වසංගත රෝග අංශය | ප්‍රධාන වසංගත විද්‍යාඥ | වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 24 මැලේරියා මර්ධන ව්‍යාපාරය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 25 බරවා රෝග මර්ධන ව්‍යාපාරය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 26 ලාදුරු මර්ධන ව්‍යාපාරය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය)" | 1 | 1 |
| 27 ක්ෂය රෝග මර්ධන ජාතික ව්‍යාපාරය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 28 ජාතික නිරෝධායන සේවා | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 29 පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 30 පෝෂණ අංශය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 31 පෝෂණ සම්බන්ධීකරණ ඒකකය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 32 තරුණ වැඩිහිටි හා ආබාධිත | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 33 වතු හා නාගරික සෞඛ්‍ය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 34 පිළිකා මර්ධන වැඩසටහන | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 35 බෝ නොවන රෝග මර්ධනය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 36 මානසික සෞඛ්‍ය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |

| *වෛද්‍ය ආයතනය (චක්‍රලේඛය 2-61/2006)* | *තනතුර* | *අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම්* | *ආයතන සංඛ්‍යාව* | *එකතුව* |
|---|---|---|---|---|
| 37 ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්ධන ව්‍යාපාරය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) | 1 | 1 |
| 38 ජාතික ඩෙංගු මර්ධන ව්‍යාපාරය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 39 තත්ත්ව කළමනාකරණ ඒකකය | අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 40 පළාත් මට්ටමේ ආයතන | පළාත් අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 9 | 9 |

| | වෛද්‍ය ආයතනය (චක්‍රලේඛය 2-61/2006) | තනතුර | අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම් | ආයතන සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|
| 41 | පළාත් මට්ටමේ ආයතන | නි/පළාත් අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 9 | 9 |
| 42 | ප්‍රාදේශීය මට්ටමේ ආයතන | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 26 | 26 |

විශේෂිත ආයතන සෞඛ්‍ය අමාත්‍යාංශය - කොළඹ

| | විශේෂිත මහජන සෞඛ්‍ය ආයතන ප්‍රධාන කාර්යාලය | තනතුර | අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම් | ආයතන සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|
| 43 | | අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සෞඛ්‍ය) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 44 | | අධ්‍යක්ෂ සැලසුම් | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 45 | | අධ්‍යක්ෂ (තොරතුරු) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 46 | | අධ්‍යක්ෂ (සංවිධාන සංවර්ධන) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 47 | | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති විශ්ලේෂණ) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 48 | | අධ්‍යක්ෂ (තෘතික සත්කාර සේවා) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 49 | | අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 50 | | අධ්‍යක්ෂ (පෞද්ගලික සෞඛ්‍ය සේවා) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 51 | | අධ්‍යක්ෂ (ප්‍රාථමික සත්කාර සේවා) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 52 | | අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයුම්) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 53 | | අධ්‍යක්ෂ (රසායනාගාර සේවා) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | 1 | 1 |

| | විශේෂිත මහජන සෞඛ්‍ය ආයතනය | තනතුර | අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම් | ආයතන සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|
| 54 | | අධ්‍යක්ෂ (වෛද්‍ය තාක්ෂණ සේවා හා සැපයුම්) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 55 | | අධ්‍යක්ෂ (පුහුණු) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 56 | | අධ්‍යක්ෂ (පර්යේෂණ ඒකකය) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |
| 57 | | අධ්‍යක්ෂ (දන්ත වෛද්‍ය සේවා) | විද්‍යාපති හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) | 1 | 1 |

12 - 723

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.